
01-කාණ්ඩය
තෙවැනි කලාපය

# පවෝද

**The Government Development Monthly**



## චිරං ජයතු

**රදපස යුග මෙහෙවර**

**1931 - 2008**

ජනපති තෙවැනි පදවි ප්‍රාප්ති
විශේෂ කලාපය

ඔදබිඳ ඔටුනු පැළැන්දූ
දිනේ
කුරහන් යායේ
සුවඳ දැනේ


මිල රු.250/=

ප්‍රකාශනයක්

# ඇතුළු පිටු

මේ පහල වී ඇත්තේ දියසෙන් කුමාරයායි
යුද්ධය 2009 වෙසක් මහේදි අවසන් වීම නියතයි
පිටු 6-7

## සිංහරාජ ආශ්චර්යය



පිටු 72-76

යුද්ධයෙන් පසු රට තනන්නට නම්
පළමුව රට තුල විනය ස්ථාපිත කළ යුතුය
59 පිටුව



## ගෙවතු වගාව

පිටු 77-78

නැවත විදුලි බිල වැඩි කිරීමට
පිටු 14-15 අපේ බලාපොරොත්තුවක් නෑ



"ජනතාවට සේවය කරන්න බැරි නම්
කොයි පක්ෂේ හිටියත් වැඩක් නෑ"
24-25 පිටු



10-11 පිටු
මූල්‍ය ආයතන
පාලනය වෙන්නේ
රටේ නීතියට අනුවයි.



23 පිටුව

## දුම්රිය ඉතිහාසයට යෝධ පිම්මක්

කලාකරුවා කියන්නේ
ආණ්ඩුවක්



52-53 පිටු


ප්‍රධාන උපදේශක



වාරිමාර්ග ජලකළමනාකරණ
වරාය හා ගුවන් සේවා ගරු අමාත්‍ය
චමල් රාජපක්ෂ මැතිතුමා

කර්තෘ මණ්ඩල උපදේශක



ජෙත්‍යතිර් විද්‍යා ශිරෝමණි ගෞරව සම්මානලාභී,
ජෙ‍්‍යාතිර් ශේඛර ගෞරව සම්මානලාභී,
ඉන්දියන් එක්සලන්ස් සම්මානලාභී දේශබන්දු
සුමනදාස අබේගුණවර්ධන

උපදේශකවරු







ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්
චසන්ත ගුණසේකර

ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්
කපිල දිසානායක

ජනාධිපති සම්බන්ධීකරණ
ලේකම්
කිත්සිරි සේපාල







මෙහෙයුම් කළමනාකරු
සමාධාන විනිසුරු දේශබන්දු ලංකාපුත්‍ර
ප්‍රසන්න මදුරාවල

ප්‍රධාන කර්තෘ
ප්‍රියන්ත මාධව ප්‍රනාන්දු

විශේෂාංග කර්තෘ
චන්දි කොඩිකාර

විශේෂාංග රචකයෝ
මුනිදාස කොල්ලගේවා
අශෝක එදිරිවීර
ඒ.ආර්. පෙරේරා


ආයතන මෙහෙයුම්
ආලින්ද වික්‍රමසිංහ
ප්‍රියන්ති ද සොයිසා

පරිගණක අක්ෂර හා පිටු සැකසුම
අයිෂි ජෙනිෆන්දි විජයනෙත්ති

ප්‍රවාහන සහයක
සම්පත් පෙරේරා



සිතුමිණ ප්‍රකාශකයෝ
නො:114, තිස්සපාර, තංගල්ල
047-2240395/ 060-2474140/ 047-4929424/ 5 047-2240395
Email - sithuminanews@slt...




| | |
|---|---|
| පරි. අංක | 6681 |
| වර්ග අංක | 808.4 |
| දිනය | |


වාරිමාර්ග ජලකළමනාකරණ
වරාය හා ගුවන් සේවා ගරු අමාත්‍ය
**චමල් රාජපක්ෂ මැතිඳුන්ගේ**
ජන්ම දිනයට සහ දශක දෙකක දේශපාලන යුග මෙහෙවරට උපහාර වේවා!

# චිරං ජයතු



## රදපස යුග මෙහෙවර

## 1931 - 2008

විසි වැනි සියවසේ මුල් කාර්තුව හැඳින්වෙන්නේ ලාංකේය යටත් විජිත පාලනයේ පශ්චිම භාගය ලෙසිනි. එවකට සර්වජන ඡන්ද බලය අහිමි හෙළයෝ සුද්දාගේ යකඩ සපත්තුවට පෑගි තෙරපී ගියහ. 1915 දී සිදුවූ සිංහල - මුස්ලිම් කැරැල්ලෙන් ඉක්බිතිව සුදු පරිපාලකයෝ මාෂල් ලෝ නීතිය යටතේ සිංහලයින් අමු අමුවේ ඝාතනය කළහ. ශ්‍රීමත් හෙන්රි පේද්‍රිස් එම ඉරණමට ඉතිහාසයේ ඇති හොඳම සාක්ෂ්‍ය වේ.

රුහුණේ ගිරුවාපත්තුව පුරාද විසිවැනි සියවසේ ප්‍රාථමික අවදියේදී දළු දැම්මේ දුප්පත්කමේ ඇතුරිකිලිය. ගුප්ත නිහැඩියාව මුසු රැහැයි නාදය එකල රුහුණේ උරුමය වී තිබුණි. එ දවස රුහුණ අවදි කළ සිංහයා වූයේ මැද මුලන ඩී.එම්.රාජපක්ෂය. හේ සුද්දාගේ යකඩ සපත්තුවට පෑගි පොඩිවී සිටි රුහුණු රට ජනතාවගේ හඬ 1931දී රාජ්‍ය මන්ත්‍රණ සභාව කරා ගෙන ගියේය. මෙරටට ඩොනමෝර් ඡන්ද ක්‍රමය ලැබීමෙන් පසු පැවති මුල්ම රාජ්‍ය මන්ත්‍රණ සභා ඡන්දයේදී ඩී.එම්. ගේ පාට වූයේ කුරහන් පාටය. එය කුරහන් සාටකයේ ආරම්භය විය.

එක් දහස් නවසිය තිස් හයේදී සිදු වූ ඩී.එම්. ගේ අභාවය ද සමග රදපස යුග මෙහෙවරේ මුල් පරිච්ඡේදය කෙළවර විය. එම හිඩැස පිරවීමට ජනතාව තෝරා ගත්තේ ඩී.එම්. ගේ සොහොයුරු ඩී.ඒ. රාජපක්ෂය. එය හුදෙක් ගිරුවාපත්තුවේ දෙල්, කොස්, පොලොස් කෑ දුගී දුප්පත් ජනතාවගේ අභිලාෂය විය. ඩී.ඒ. බෙලිඅත්තෙන් 1947දී පාර්ලිමේන්තු ගියේය. මුලින් ඉංග්‍රීසින් හා තම කුසපොත්තට ඇලුණු ජනතාව වෙනුවෙන් ගරබ පෑ ඩී.ඒ. එතැන් පටන් දේශීය කළු සුද්දන් හා සටන් කළේය. 1951දී එස්.ඩබ්ලියු.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතානන් යු.එන්.පී. ය හැරදා විපක්ෂයට යද්දී ඔහුගේ සෙවනැල්ල වූයේ ඩී.ඒ.ය. 56 යුග පෙරලිය එහි ගමනාන්තය විය.

ඇඹිලිපිටියේ චන්ද්‍රිකා වැව වාරියෝජනා ක්‍රමය ඩී.ඒ. රාජපක්ෂ යුග මෙහෙවරේ කූටප්‍රාප්තිය සේ සැළකේ. එය 1957දී අගමැති බණ්ඩාරනායක මහතා අතින් විවෘත විය. අහස් දියෙන් පුරන් කෙත් අස්වැද්ද ගිරුවාපත්තුවේ ගොවියාට චන්ද්‍රිකා වැවේ දියවර අදටත් සෙත් ශාන්තියක් වී තිබේ.

ඩී.ඒ. ගේ දේශපාලන පොත ලියැවී තිබුණේ කෙතේ අස්වැන්නෙනි. වැවේ දියවරෙනි. වීරකැටිය ඩී.ඒ. රාජපක්ෂ මැදි විද්‍යාල තැණුනේ රාජපක්ෂලාගේ සින්නක්කර ඉඩමකය. මුරුතවෙල ජල යෝජනා ක්‍රමය රදපස යුග මෙහෙවරේ තවත් කඩඉමකි.

ඩී.ඒ. රාජපක්ෂ මහතා 1967 දී අභාවප්‍රාප්ත විය. එයින් රදපස යුග මෙහෙවරේ දෙවැනි කාර්තුවට තිත වැටුණි. එවකට විපක්ෂ නායිකාව වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය බෙලිඅත්ත ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නව සංවිධායකධුරයට තෝරාගත්තේ එදා විසි දෙහැවිරිදි වියේ පසුවූ තුරුණු මහින්ද රාජපක්ෂය. මහින්ද 1970දී එවකට මෙරට ලාබාළම මන්ත්‍රීවරයා ලෙසින් පාර්ලිමේන්තු ගියේය.

එක් දහස් නවසිය හැත්තෑ හතේදී තරුණ මහින්ද බෙලිඅත්තෙන් පරාජය විය. එතැන් සිට සතුරෝ ඔහු වට කොට පහර දුන්හ. හෙතෙම බොරු චෝදනාවකට බන්ධනාගාරගත කෙරුණි. තම මෑණියන්ගේ මළගමට ඔහු ආවේ රක්ෂිත බන්ධනාගාරයේ සිටය.

උතුරු දකුණු යුද්ධයෙන් රට අරාපික වූ භීෂණ සමයේදී මහින්ද දකුණේ මිනිසුන්ගේ ජිවිත අයිතිය ඉල්ලා පාරට බැස්සේය. එවකට බොහෝ දේශපාලකයෝ හුණෝනේ ගම්බිම් අත්හැර ගොසිනි. මිනීකන්නන්ගේ දේශයේ මළ මිනී මත සිට මහින්ද ජනතාවගේ ජිවිත අයිතිය ඉල්ලා සටන් කළේය. 1991 දී ඔහු මෙරට මානව හිමිකම් වාර්තාව පිනිවා මානව හිමිකම් කොමිසම වෙත රැගෙන ගියේය. එයින් ආණ්ඩුවේ ජනතා මර්ධනය ද මට්ටු විය.

එක්දහස් නවසිය අනූදෙකේදී මහින්ද රාජ්‍ය ත්‍රස්තවාදයට එරෙහිව කොළඹ සිට කතරගමට පා ගමන් ගියේය. ජනඝෝෂා කළේය. එයින් නිදාසිටි විපක්ෂය අවදි විය. 94දී දාහත් අවුරුද්දකට පසු රටේ බලය ඇල්ලුවේ මහින්ද නින්දෙන් අවදිකළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි.

මහින්ද අනූ හතර පොදුජන එක්සත් පෙරමුණු රජයේ කම්කරු හා වෘත්තිය පුහුණු අමාත්‍යධුරයට පත් විය. කම්කරු ප්‍රඥාප්තිය සකස්වීම ඇරඹුණි. එයින් තක්කු මුක්කු වූ ධනේෂ්වර පාලක පංතිය ඔහුව ධීවර අමාත්‍යංශයට මාරු කළේය. එහිදී ඔහු සාගර විශ්ව විද්‍යාලය ආරම්භ කළේය.

දෙදහස් හතර වසරේ බක්මහේ දෙවෙනිදා රුහුණේ මහින්ද

රටේ අගමැති ෆනතුරේ දිවිරුම් දුන්නේය. රට සුනාමියෙන් සේදී ගියේ ඊට අට මසක අවැමෙනි. එදා රටේ දෙවෙනි පුරවැසියා ලෙසින් මහින්ද රාජපක්ෂ උදම් රළින් වත්කම් ඇදිවතට පමණක් සීමාවූ ජනතාවගේ ඉරණමට මුහුණ දුන්නේය. ඔහු රට ගොඩ නැඟීම පටන් ගත්තේ සුනාමියෙන් මුහුදු බත් වූ රටේ සිව් දිග ප්‍රතිශංස්කරණයට අත්පොත් තබමිනි.

මහින්ද රාජපක්ෂ 2005 නොවැම්බර් මස 17 වෙනිදා නිදහස් ලංකාවේ පස්වැනි විධායක ජනාධිපතිධුරයට පත් විය. එවිට රට තිබුණේ කොටි කටේය. ඔහු මුලින් කොටියාට සාමයේ හස්තය දිගු කළේය. 2006 ජූලි දෙවෙනිදා මාවිල් ආරු සොරොව්ව වසා දැමූ කොටියාට විරුද්ධව ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ සටන හෙතෙම ආරක්‍ෂක ලේකම් ගෝඨාභය රාජපක්‍ෂට පැවරුවේය. අද රට කොටි කටින් ගලවා ගැනීමේ සටනට උරදී සිටින්නේ මේ රදපස අයිය - මලෝය.





ගිරුවාපත්තුවේ සංවර්ධන ක්‍රියාවලියට අද ලැබී ඇති යෝධ හයි හත්තිය ඩී.ඒ. රාජපක්‍ෂගේ දෙටු පුත් අමාත්‍ය චමල් රාජපක්‍ෂය. ඔහු වත්මන් රජයේ වාරිමාර්ග ජල කළමණාකරන සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යධුරය හොබවයි. හෙතෙම වර්තමාන හම්බන්තොට සංවර්ධනයේ පෙරගමන් කරුය.

දැන් මව්ආර ජලාශයේ දියවර උඩවලව වනෝද්‍යානයේ සිට මත්තල තෙක් ගලාබසී. ඉන් මීගහජඳුරේ කෙත්වතු පිදී තිබේ. වලව වම් ඉවුර ජල යෝජනා ක්‍රමය හම්බන්තොට - තිස්ස පුරන් කෙත් අස්වද්දයි. මේ අතර උමා ඔයේ ජල කඳ උඩරට වැලිමඩ සානුවේ සිට ලුණුගම්වෙහෙර තෙක් ගෙන ඒමට යෝජිතය. මේ සියල්ල චමල් රාජපක්‍ෂ පොදු ජන මෙහෙවරේ අතු ඉතිය.

විසි වැනි සියවසේ මුල් කාර්තුවේ දී හම්බන්තොට උප දිසාපතිවරයාව සිටි ලෙනාඩ් වුල්ෆ් තම දුර දක්නා කණ්නාඩියෙන් හම්බන්තොට අවට මුහුදේ ඔබ මොබ යන විදෙස් නෞකා දුටුවේය. පුරාණ සේද මාවතේ පිහිටි දක්ෂිණ ලංකාවට අංග සම්පූර්ණ වරායක් ඉල්ලා හේ බ්‍රිතාන්‍ය රජයට ලිපි ලිව්වේය. එදා සිට නිදහසින් පසු බිහිවූ මෙරට පාලක පංතිය ද පොතට පමණක් සීමා කර තුබූ හම්බන්තොට වරාය ඉදිකිරීමේ සේද මාවතේ සංවර්ධන විප්ලවයට අත්පොත් තැබුණේ මහින්ද - චමල් අයිය මලෝ සුසංයෝගයෙනි. 2007 වසරේ ඉල් මහේදී මුල්ගල තැබුණු හම්බන්තොට වරායේ ඉදිකිරීම් 2010දී අවසන්විමට නියමිතය. ඊට සමගාමීව වීරවිල ගුවන්යානා තොටුපළේ ද වැඩ නිම කිරීමට යෝජිතය.

දශක දෙකක යුධ අන්ධකාරයෙන් වැසී සිටි නැගෙනහිර ජනතාවට දැන් අලුත් ඉරක් පායා ඇත. ඒ වත්මන් රදපස සිව්රඟ සේනාවේ අංකුර පුරුක පාර්ලිමේන්තු මන්ත්‍රී බැසිල් රාජපක්‍ෂය. ඔහු මේ වන විට නැගෙනහිර නවෝදයට උරදී සිටී. උතුරු දිග යුද්ධයේ ගිණි දළු නිවියෑමත් සමඟ නැගෙනහිරින් නැගෙන හිරු රැස් වන්නි ගම් බිම් කරාද පතුරාලීම බැසිල් රාජපක්‍ෂ මැතිඳුන්ගේ අදිටනය.

මේ වන විට ආරක්ෂක ගමුදාවෝ වන්නි කොටි ගඳවතේ දොරකඩ සිටිති. මුලතිව් වන් ගෝ බේස් ඇත්තේ අතේ දුරිනි. ඒ අතරම මහින්ද රාජපක්‍ෂ ආණ්ඩුව රටේ යටිතල පහසුකම් ද වර්ධනය කරමින් සිටිග කැළණිය ගුවන් පාලම ඉදිවිය. කෙරවලපිටිය විදුලිබලාගාරය ඊයේ පෙරේදා විවෘත විය. නොරොච්චෝලේ තාප බලාගාරය ඉදිවෙමින් පවතී. දක්ෂිණ ලංකා අධිවේගි මාර්ගය, මාතර - කතරගම දුම්රිය මඟ, වැල්ලවාය - මාතර මහා මාර්ගය ජනතාකරණය වෙමින් පවතින ව්‍යාපෘතිය.

රදපස පරපුරේ හීනය තිල්ල පැතිරුණු රටකි. නිවහල් ජාතියකි. ලක්මවට සුබ අනාගතයකි. මේ ඊට කාලයයි. අප සැවොම එක්ව පිය නගමු.

## චිරං ජයතු !

ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්
වසන්ත ගුණසේකර විසිනි.



# අභියෝගාත්මක වසරක් තුළ සමතුලිත සංවර්ධයක් ඇති කළා

## මුදල් අමාත්‍යංශ වාර්ෂික වාර්තාව එළි දක්වමින් ජනපති කියයි

අප මුහුණ දී තිබුණු විශාල අභියෝගයක් තමයි එක පැත්තකින් මේ රටේ පළාතක් ත්‍රස්තවාදීන් වෙන් කර ගෙන පරිපාලන ප්‍රදේශ වශයෙන් ඒවායින් අපේ හමුදාව පොලිසිය ඉවත් කර ගෙන වෙනම රාජ්‍යයක් ගොඩනගා ගැනීමට ගෙන ගිය වැඩපිළිවෙලට එරෙහිව ක්‍රියාත්මක වීම. අනෙක් පැත්තෙන් සංවර්ධන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යා යුතුයි. දවසින් දවස වැඩි වන තෙල් මිලට ආහාරමිලට අප මුහුණ දිය යුතුය. මුදල් අමාත්‍යංශය විසින් වාර්ෂිකව එළි දක්වන 2007 වාර්ෂික වාර්තාව පිළිගැනීම වෙනුවෙන් එම අමාත්‍යංශයේ රන් දොර ශ්‍රවනාගාරයේදී පැවති උත්සව සභාව අමතමින් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා එසේ පැවසීය.

රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් මෙම වාර්ෂික වාර්තාව සකස් කර තිබුණි. මෙහිදි වැඩි දුරටත් කතා කළ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා, අපි ජනතාවට මහින්ද චින්තනයෙන් ලබා දීමට පොරොන්දු වූ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතුයි. කොයි අවස්ථාවකවත් අපට එය වෙනස් කරන්න බැහැ. ඒ මගේ පෞද්ගලික විශ්වාසයයි. ඒ නිසා මේ ප්‍රතිපත්ති වල ඉඳගෙනයි සියලු අභියෝග වලට මුහුණ දිය යුත්තේ.

මෙහිදි පැහැදිලි වෙනවා මොන ආකාරයේ සංවර්ධනයකටද මොන ආකාරයේ ආරක්ෂක වැඩපිළිවෙලකටද අප ගිහින් තියෙන්නේ කියා. මොන ආකාරයේ ජයග්‍රහණයක්ද අපි ලබා ගත්තේ කියා. එක පැත්තකට සීමා වෙලා තිබුණු සංවර්ධනය අනෙක් ප්‍රදේශවලට ගෙනියන්න, මිනිසුන්ගේ දුප්පත් කම නැති කරන්න, අභියෝග ජයගන්න අපිට ඕන වුණා. ඒ සඳහා අවශ්‍ය යම් යම් ක්‍රියාමාර්ග ගන්න අපිට සිදු වුණා. එක පැත්තකින් අපිට ආරක්ෂාව තිබිය යුතුයි. පොලිසියට හා හමුදාවට ඒ සඳහා අවශ්‍ය ශක්තිය හා වියදම් ලබා දිය යුතුයි, මේ ජයග්‍රහණ සඳහා අවශ්‍ය පියවර ඉදිරියට ගෙන ගියා. යුද්ධය නිසා සංවර්ධනය නතර කළේ නෑ. වැටුප් වැඩි වීම් නතර කළේ නෑ. රාජ්‍ය අංශයට සේවකයින් බඳවා ගැනීම් නතර කළේ නෑ. මිලියන 1.1ක් වන රාජ්‍ය අංශය ශක්තිමත් කළා. එදා ස්ථිර වැඩ පිළිවෙලක් නොතිබුණු ග්‍රාමීය සංවර්ධනය දියුණු කිරීමේ අභියෝගයට මුහුණ දුන්නා. අනෙක් පැත්තෙන් ආහාර අර්බුදය. එදා අපිට ණයට තිරිඟු පිටි දීලා අපිව ඒකට හුරු කළා. ඒ ණය අපි තාම ගෙවනවා. මේ අර්බුදය අපි දැක්කේ මීට අවුරුදු 03කට කලින් එක්සත් ජාතින්ගේ සංවිධානය අදයි ඒ ගැන සාකච්ඡා කරන්න ගත්තේ. අපි ඉදිරිය දැකලයි කටයුතු කළේ. කෙටිකාලින විසඳුම් සෙව්වේ නෑ. මේ රටේ දුගී දුප්පත් බව නැති කරන්න දස අවුරුදු වැඩපිළිවෙලක් හැදුවා. රටේ සංවර්ධනයට අවශ්‍ය පසුබිම සකසන්න වැඩපිළිවෙලක් හැදුවා.


මේ අතරම ගම නැගුම ක්‍රියාත්මක කළා. නොරොච්චෝලේ, ඉහළ කොත්මලේ, කෙරවලපිටිය හැදුවේ නැතිනම්, ත්‍රිකුණාමලේ සාම්පූර් බලාගාර හදන්න ආරම්භ කළේ නැතිනම්, අපිට විශාල විදුලි අර්බුදයකට මුහුණ දෙන්න සිදුවෙනවා. අවුරුදු 20කට පස්සේ හරි උමා ඔය වගේ ව්‍යාපෘති ආරම්භ කළේ විදුලි අර්බුදය ඉදිරියට ගෙන යන්න උවමනා නැති නිසා. කොළඹ ඔලුවිල් හම්බන්තොට වරායවල් සාදා සංවර්ධනය ඉදිරියට ගෙන ගියා. නැගෙනහිර ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කළා. අපි ගිය අවුරුද්දේ මැයි වෙනකොට කතා කළේ වාකරේ රෝහලට බෙහෙත් යවන්නේ කොහොමද කියා. මේ අවුරුද්දේ මැයි වලදි කතා කළේ වාකරේ සංවර්ධනය ගැන, 20 වසරක් සංවර්ධනය ආපස්සට ගිය පළාතක් අපි හැදුවා. යම් යම් අඩුපාඩුකම් ඇති. අපි ඒවා හඳුනා ගනිමු. මේ වර්ෂයේ සෞඛ්‍ය වියදම් ආහාර ද්‍රව්‍ය තෙල් මිල විශාල ලෙස ඉහළ ගියා. මේක කවුරුත් දන්නේ නෑ, සමෘද්ධිය වැඩි කළා. සහනාධාර දුන්නා. රුපියල් 350ට පොහොර දුන්නා. මේ රටේ දුප්පත් කම අඩු කිරීමේ අනාගත වැඩපිළිවෙල අපි ක්‍රියාත්මක කළ යුතුයි. ඒ නිසා පටු මත වාද වලට ඉඩ දෙන්නේ නැතිව තම මාතෘ භූමිය ගැන විතරක් සිතා මේ රටේ මිනිසුන්ගේ ජීවන තත්වය ඉහළ නංවන්න රටේ සංවර්ධනය නංවන්න හැමදෙනාගේම සහය ලබා දෙන්නයි ඉල්ලා සිටිනවා. මෙම අවශ්‍යතාවයට රාජ්‍ය ආදායම් ඇමති සහ මුදල් ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමති රංජිත් සියඹලාපිටිය, මුදල් අමාත්‍යංශයේ හිටපු ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර, නියෝජ්‍ය ලේකම් ආචාර්ය ආර්.ඒ ජයතිස්ස, අධ්‍යක්ෂ ජෙනරාල් එස්.ආර් ආටිගල යන මහත්වරුන් ඇතුලු විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

මුනිදාස සෙල්ලහේවා

# ජය ගොඩනැංවූ තෙවසරක යුධ අභිමන



රුපුසෙන් ඔදබිඳ ඔටුනු සැළැන්ඳු
නිරිඳාණෝ එඩිබලය දිනේ
සිහධජ සෙවණේ කුරහන් යාගේ
ජය ධජ නැංවෙන සුවඳ දැනේ




## නැගෙනහිර සටන

- හතරවන ඊළාම් යුද්ධය ඇරඹූ කොටි ත්‍රස්තයන් මුතූර් ඇතුළු ත්‍රිකුණාමල දකුණේ හමුදා කඳවුරුවලට පහර දී ත්‍රිකුණාමල වරාය දක්වා බලය අල්ලීමට ගත් කොටි තැත ව්‍යර්ථ කිරීම - 2006 අගෝස්තු 01දා

- මාවිල් ආරු සොරොව්ව විවෘත කිරීම - 2006 අගෝස්තු 08 වැනිදා (කොටි ත්‍රස්තයන් මාවිල්ආරු සොරොව්ව 2006 ජූලි 26දා වසා දමන ලදි.)

- සාම්පූර් මුදාගැනීමේ මෙහෙයුම 2006 අගෝස්තු 27

- උප්පාරු, ගංගෙයි, මනිරාසකුලම් කොටි කඳවුරු අත්පත් කර ගැනීම.

- පනිච්චන්කර්නි, වාකරේ, වෙරුගල් දක්වා මුදා ගැනීම. (2007 ජනවාරි 21)

- තොප්පිගල මුදා ගැනීම. (2007 පෙබරවාරි 24 සිට ජූලි 11 දක්වා)

## වන්නි සටන

- සිලාවතුර, අරිප්පු, කොන්ඩච්චි මුදා ගැනීම. (2007 සැප්තැම්බර් 01 දා ඇරඹිණි.)

- 57 සේනාංකය මඟින් තම්පනේ, පෙරියතම්පනේ, විලාත්තිකුලම්, තුනුක්කායි, මල්ලාවි මුදා ගැනීම. (2007 මාර්තු සිට)

- මඩු ප්‍රදේශය මුදා ගැනීම.

- 58 සේනාංකය මඟින් අඩම්පන්, උයිලන්කුලම්, පල්ලක්කුලි, යෝධවැව සිට මන්නාරම සහල්නැලිය මුදා ගැනීම. (2008 ජූනි 29 දා වන විට)

- 2008 ජූලි වන විට වෙඩිතලතිව්, ඉලුප්පකඩවායි, වෙල්ලන්කුලම් කොටි බලකොටු අත්පත් කර ගැනීම.

- වල්ලපාඩු, පාලවි, කිරන්චි මුදා ගැනීම. (2008 නොවැම්බර්)

- පූනරීන්, පරන්තන් (බී-69) මාර්ගය මුදා ගැනීම. (2008.11.14)

- පූනරීන් මුදා ගැනීම. (2008.11.17)

- මාන්කුලම් මුදා ගැනීම. (2008.11.17)

- කුමුලමුණේ මුදා ගැනීම. (2008.11.17)

---

රවීන්ද්‍ර පෙරේරා

ජනාධිපති කාර්යාල
පුස්තකාලය
REFERENCE



# මහින්ද චින්තනයෙන්...

## රාජ්‍ය අංශය

■ 2005 අයවැයෙන් ක්‍රියාත්මක වූ වැටුප් වර්ධකයේ ඉතිරි කොටස 2006 ජනවාරි මාසයේ සිට ඔබට ලබා දෙන්නෙමි.

■ මීට අමතරව වැඩි වන ජීවන වියදම දරා ගැනීම සඳහා ආරම්භක දීමනාවක් ලෙස මසකට රුපියල් 1000ක් ගෙවීමට කටයුතු කරන්නෙමි. සෑම 06 මසකට වරක්ම වැඩිවන සෑම ජීවන අංශයකටම රුපියල් 2.50 බැගින් ගණනය කර ඉහත රුපියල් 1000ට එකතු කරන්නෙමි.

■ හමුදා හා පොලිස් සේවා ඇතුළු රාජ්‍ය අංශයේ සියළු සේවකයන් 2005 වසර තුලදී ලබා නොගත් නිවාඩු සඳහා එක් දිනකට දෙගුණය බැගින් වූ හිලවු දීමනාව ලබන වසරේ සිට ජනවාරි මාසයේ පටන් ගෙවීමට කටයුතු කරන්නෙමි.

■ රාජ්‍ය සේවකයකු පියකු වන විට දින තුනක විශේෂ නිවාඩුවක් ලබා දීමට පියවර ගන්නෙමි.

■ කාර්ය සාධනය මත පදනම් වන නව දිරි දීමනා ක්‍රමයක් හඳුන්වා දෙමි.

■ පවුල් වල සාමාජිකයින්ද ආවරණය වන පරිදි රජයේ සේවකයන්ට නව සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් ලබා දීමට කටයුතු කරමි.

■ රාජ්‍ය අර්ධ රාජ්‍ය සහ සංස්ථා මණ්ඩල වල නිළධාරින් සඳහා අපේ රජයන් විසින් මීට පෙර අවස්ථා වලදී ක්‍රියාවට නංවා ඇති තීරු බදු රහිත වාහන ආනයන බලපත්‍ර නැවත ලබා දීමට කටයුතු කරමි.

■ වර්තමානයේදී රජයේ සේවකයින්ට ලබා දෙන පස් අවුරුදු නිවාස ණය ක්‍රමය දැනට හිමිකම් නොකියන රාජ්‍ය සංස්ථා වලටත් ලබා දෙන්නෙමි. ණය මුදලේ ප්‍රමාණය දැනට පවතින උපරිමය වන ලක්ෂ 20 සිට ලක්ෂ 30 දක්වා වැඩි කරන අතර කාළය වසර 5 සිට වසර 7 ක් දක්වා දීර්ඝ කරමි.

■ රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳව මෑත කාළයේ සිදු කරන ලද සියලු සංශෝධනයන් ඉවත් කොට මේ වන විට රාජ්‍ය සේවයේ යෙදෙන සියළු දෙනාටත් ඉදිරියේදී බඳවා ගන්නා සියලු දෙනාටත් විශ්‍රාම වැටුප් ලැබීමට ඇති අයිතිය සහතික කරමි.

■ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල මගින් එහි සාමාජිකයින්ගේ පහසුව සඳහා විශේෂඥ වෛද්‍ය සේවා සහිත ආරෝග්‍යශාලාවක් ආරම්භ කරමි.

■ 1980 ජූලි වර්ජකයන්ගේ මෙතෙක් නොවිසඳී ඇති ගැටලු නිරාකරණය කිරීම සඳහා කඩිනම් පියවර ගන්නෙමි.

## පෞද්ගලික අංශය

■ වසර ගණනක් තිස්සේම නිවැරදිව බදු ගෙවා අප රටේ සංවර්ධනයට දායක වූ බදු ගෙවන්නන්ට විශේෂ පිළිගැනීමක් ලබා දීමට මම අදහස් කරමි. ඒ සඳහා වසරකට රුපියල් 250000කට අවමයකට යටත් වී වසර 05ක ආදායම් බදු ගෙවා ඇති සියළුම පුද්ගල බදු ගෙවන්නන්ට තීරු බදු රහිතව වාහන ආනයන බල පත්‍රයක්. ලබා දීමට කටයුතු කරමි.

■ පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා සේවක අර්ථ සාධක අරමුදල රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ බැංකු ඒකාබද්ධ කොට අඩු පොලියට නිවාස ණය ලබා දීමේ වැඩ පිළිවෙලක් සකස් කරමි.

## විදේශ සේවා නියුක්තිය

■ ජාතික ආර්ථිකයේ සුරක්ෂිතභාවය වෙනුවෙන් විදේශ රැකියාවල නියුතු අප සහෝදර සහෝදරියන් කරණු ලබන කැප කිරීම මම මහත් සේ අගය කරමි. ඔවුන් සහ ඔවුන්ගේ පවුල් වල ආරක්ෂාව හා සුභ සිද්ධිය වෙනුවෙන් අප මේ දක්වා අනුගමනය කර ඇති ක්‍රියා මාර්ගයන් හි පවතින දුර්වලතාවයන් මඟ හරවා ඔවුනට ඔවුනගේ පවුල්වලට හා රටට ඉහළම ප්‍රතිලාභ ලැබෙන නව ක්‍රමවේදයක් සකසමි. ඒ අනුව

■ දැනටමත් විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් එළඹ තිබෙන එකඟතාවන්ට අනුව 2006 වසරේදී පමණක් කොරියාව මැලේසියාව ඇතුළු රටවල රැකියා 100000ක් ලබා දීමට කටයුතු කරමි. ඊළඟ වසර වලදී මෙම සංඛ්‍යාව තවත් වැඩි කර ගැනීම සඳහා ඒ ඒ රටවල් සමඟ අලුත් එකඟතාවන් ගොඩනඟා ගැනීමට කටයුතු කරමි.

■ ගෘහ සේවිකාවන් වෙනුවට හෙද, නාවික හා පරිගණක වැනි ක්ෂේත්‍ර සඳහා වැඩිපුර රැකියා අවස්ථා උදා කරමි.

■ විදේශ රැකියා කොට ආපසු පැමිණෙන අය සඳහා දෙනු ලබන තීරු බදු රහිත දීමනාව ඇමෙරිකානු ඩොලර් 5000 දක්වා ඉහළ නංවමිග එසේම මෙරට පැමිණ පළමු මාස 6 තුළදී එය පාවිච්චි කිරීමට හැකිවන ලෙස් නීති සංශෝධනය කරමි.

■ රාජ්‍ය හා පෞද්ගලික බැංකු මඟින් 30%ක රජයේ දායකත්වයක් ඇතිව විශේෂ නිවාස ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙමි.

■ රැකියා සඳහා විදේශගත වන්නන්ට ඒ සඳහා වැයවන මූලික වියදම් පියවීමට අවශ්‍ය බැංකු ණය පහසුකම් ලබා දීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකසන්නෙමි.

■ විදේශ සේවා නියුක්තිකයන්ගේ පවුල්වල දරුවන් සඳහා ගම් මට්ටමින් සුභ සාධන ව්‍යාපෘති ආරම්භ කරමි.

■ විදේශ සේවා නියුක්තික කාන්තාවන්ගේ ආරක්ෂාව තහවුරු කරමි.

■ විදේශ රැකියාවලට යාමට බලාපොරොත්තු වන තරුණ තරුණියන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ලියාපදිංචි කර ඔවුනට අවශ්‍ය පුහුණු වීම් ලබා දීමට කටයුතු කරමි.

■ යුරෝපීය රටවල හෙද සේවය සඳහා විශාල ඉල්ලීමක් තිබේ. එම රැකියා වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් හෙදියන් හා හෙද නිලධාරීන් පුහුණු කිරීමට ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන නව හෙද විදුහලක් පිහිටුවනු ලැබේ.

■ විදේශ රටවල සේවය කරන අය වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.

මහු සම්බන්ධයි